Volume 1 Issue 1 June 2006 ISSN 1800-0215

# MNBD පුවත්

ජාතිය ගොඩනැගීමේ සහ සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

මෙවර කලාපයෙන් : මහින්ද චින්තන කඩිනම් සංවර්ධන වැඩසටහන



ඡායාරූප : සුදත් සිල්වා

2004 වසරේ ස්ථාපිත කරන ලද සහන පුනරුත්ථාපන හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය නමින් වර්තමාන ආණ්ඩුව විසින් විශේෂයෙන්ම නැවත සකස් කර ඇත්තේ ගැටුම්වල අළපැළුමට යටත් වූ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ප්‍රශ්න විසඳීමටත් ඔවුන් මුහුණපාන දුෂ්කරතා සමනය කිරීමට හැකි වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටත්ය. ඒ අනුව ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය විසින් උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක අටක හා ආශ්‍රිත දිස්ත්‍රික්ක පහක පුනරුත්ථාපන නැවත ඉදිකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘති අතර දේශීය අරමුදල් හා විදේශීය අරමුදල් යොදා ක්‍රියාත්මකවන ව්‍යාපෘති ද වේ.



ප්‍රජා සහභාගීත්ව සංවර්ධන සාකච්ඡා

## මහින්ද චින්තන ත්‍රෛයිමාසික කඩිනම් සංවර්ධන වැඩසටහන

ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන මහින්ද චින්තන ත්‍රෛයිමාසික කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ දේශීය අරමුදල් උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන වැඩසටහන් සඳහා වෙන්කළ මුළු මුදල රු. මිලියන 325 කි. එක් දිස්ත්‍රික්කයකට රු. මිලියන 25 බැගින් අම්පාර,අනුරාධපුරය පොළොන්නරුව, පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වව්නියාව, හම්බන්තොට, මොණරාගල යන දිස්ත්‍රික්ක සඳහා දැනටමත් මෙම මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

මහින්ද චින්තන වැඩසටහන යටතේ ක්‍රියාත්මක **"සමෘද්ධිමත් ගමක්"** සංකල්පය සඳහා යෝජිත වැඩසටහන් වනුයේ

විදුලි බලය සැපයීම,
පානීය ජල පහසුකම් සැපයීම,
ප්‍රවේශ මාර්ග සංවර්ධනය ,
පාසැල් සඳහා පහසුකම් සැපයීම,
සෞඛ්‍ය අවශ්‍යතා වැඩි දියුණුකිරීම,
ප්‍රජා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම,

විදුලිබල ව්‍යාපෘතිය යටතේ විදුලිය සැපයීම හා දීර්ඝ කිරීම, ජල සම්පාදන පහසුකම් සැපයීම යටතේ පොදු ළිං හා නල ළිං ඉදිකිරීම,



ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිය ලබාදෙමින්

සුභසාධක මධ්‍යස්ථාන හා නැවත පදිංචි කිරීමේ ගම්වලට ජලය සැපයීම, පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය සහ පාලම් ඉදිකිරීම, සමාජ සුභසාධනය සඳහා ප්‍රජාශාලා ඉදිකිරීම ,අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ පාසැල් ගොඩනැගිලි ඉදිකිරීම හා ක්‍රීඩාපිටි ඉදිකිරීම, සෞඛ්‍ය ව්‍යාපෘතිය යටතේ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම, දිසා රෝහල්වල වාට්ටු සංකීර්ණ ඉදිකිරීම්, බාහිර රෝගී ප්‍රතිකාර අංශ වැඩිදියුණුව, මධ්‍යම බෙහෙත් ශාලා සංවර්ධනය, සනීපාරක්‍ෂක කටයුතු වැඩිදියුණු කිරීම, වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේ ඇළමාර්ග, වැව් අමුණු ප්‍රතිසංස්කරණය ආදි වැඩකටයුතු මෙම කඩිනම් සංවර්ධන ව්‍යාපෘති යටතේ ඒ ඒ දිස්ත්‍රික්කවල සාර්ථක මට්ටමින් ක්‍රියාත්මක වේ.



නව පිවිසුම් මාර්ග ඉදි කරමින්

මහින්ද චින්තන කඩිනම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහිලා විදේශ ආධාර ලබන ව්‍යාපෘති 19 අතුරින් ව්‍යාපෘති 10 ක් හඳුනාගෙන ඇත. ඒ සඳහා වෙන් කළ මුදල රු. මිලියන 3178.25 කි.මෙම ව්‍යාපෘති යටතේ නිවාස ඉදිකිරීම, පාලම් ඉදිකිරීම, ජලසම්පාදන ව්‍යාපෘති, අධ්‍යාපනය හා සෞඛ්‍ය අංශයන්හි වැඩි දියුණුව, කෘෂිකර්මාන්ත සංවර්ධනය, වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම අධ්‍යාපනය සඳහා ආහාර වැඩසටහන, මව සහ දරුවා පෝෂණය කිරීමේ වැඩසටහන, සංවර්ධන වැඩසටහන් සඳහා යන්ත්‍රෝපකරණ සැපයීම සිදු කෙරේ.

**දැක්ම**

*සාමකාමී භේද රහිත සෞභාග්‍යමත් ඒකීය ශ්‍රී ලංකාවක්*

**මෙහෙවර**

*අඩි ගැටුමෙන් පීඩනයට පත් ප්‍රදේශ විශේෂිත කොට යෝග්‍ය ප්‍රතිපත්ති , වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් මෙරට පැවති සාමකාමී පරිසරය නැවත ඇති කිරීමට දායකවන පරිසරයක් ගොඩනැගීම, ප්‍රතිසන්ධානය සහ ජනවාර්ගික සුහදතා ප්‍රවර්ධනය මගින් සමාජ ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම සහ සියලු ප්‍රජාවන්ට සමාන අවස්ථා ලැබීම සහතික කිරීම*

BKT 0251
26/08/2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# දේශීය අරමුදල් යොදා ක්‍රියාත්මක ව්‍යාපෘති



පාලම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක පුනරුත්ථාපන වැඩසටහන් අතර

- වන්දි ලබාදීම,
- විශේෂ ව්‍යාපෘති,
- යටිතල පහසුකම් සංවර්ධනය,
- යාපනය දිස්ත්‍රික්කයේ සැලසුම් කඩිනම් කිරීම වේ.

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2006 වසරට භාණ්ඩාගාරයෙන් වෙන් කර ඇති මුළු මුදල රු. මිලියන 1657 කි. එම අරමුදල් පහත දැක්වෙන පරිදි ඒ ඒ දිස්ත්‍රික් සඳහා වෙන්කර ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | යාපනය | 420.50 | 09 | පුත්තලම | 62.00 |
| 2 | මඩකලපුව | 155.00 | 10 | අනුරාධපුරය | 73.00 |
| 3 | ත්‍රිකුණාමලය | 152.00 | 11 | මොණරාගල | 40.00 |
| 4 | කිලිනොච්චි | 131.50 | 12 | හම්බන්තොට | 60.00 |
| 5 | මන්නාරම | 86.30 | 13 | අම්පාර | 130.00 |
| 6 | මුලතිව් | 120.30 | ♦ | සැලසුම් | 20.00 |
| 7 | වව්නියා | 93.30 | ♦ | අනෙකුත් දිස්ත්‍රික්ක | 5.00 |
| 8 | පොලොන්නරුව | 65.00 | ♦ | ඉතිරි වැඩ සඳහා | 43.00 |

## කැබිතිගොල්ලෑවට ජල බවුසරයක්

ජනතාවට සහන සැලසීම වශයෙන් ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය විසින් පානීය ජලය සැපයිය හැකි බවුසරයක් හා ගලියක් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දෙන ලදි.





ග්‍රාමීය මාර්ග පිළිසකර කිරීම ඇරඹීම



ඇළ මාර්ග තැනීමට ගමේ ශ්‍රමය යොදා ගැනීම

ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

අමාත්‍ය :- අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා

නියෝජ්‍ය අමාත්‍ය :- ගරු ද.මු. දසනායක මැතිතුමා

ලේකම් :- එම්.එස්. ජයසිංහ මහතා

අතිරේක ලේකම් (පාලන) :- ආර්.ජේ.ජේ.කේ. රණවක මහතා

අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන) :- ටී. කුමාරදාසන් මහතා



වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා නිර්මාණය

## විදේශීය අරමුදල් යොදා ක්‍රියාත්මක ව්‍යාපෘති

ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය යටතේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක විදේශ ආධාර ලබන ව්‍යාපෘති සංඛ්‍යාව 19 කි. මෙම ව්‍යාපෘති සඳහා මෙම වසරට රුපියල් මිලියන 7862 ක් ඇස්තමේන්තු ගත කර තිබේ.
ඒ අනුව

- සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (UNHCR) විසින් අරමුදල් ලබාදෙන අභ්‍යන්තර අවතැන් වූ තැනැත්තන් සඳහා වූ ජාතික ආරක්ෂක සහ කල්පවත්නා විසඳුම් වැඩසටහනට වෙන් කර ඇති මුදල රු. මිලියන 10 කි

- යාපනය දිස්ත්‍රික්කයේ යාපනය මහ නගර සහා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ජල සංරක්ෂණ සහ පාරිසරික කළමනාකරණ ව්‍යාපෘතිය (NORAD) සඳහා වෙන් කළ මුදල රු. මිලියන 52.22 කි.

- එක්සත් රාජධානියේ හොංකොං සහ ෂැන්හයි බැංකු සමාගමේ (UK HSBC) අරමුදල් යටතේ උතුරු නැගෙනහිර පාලම් පුනරුත්ථාපනය කිරීම සඳහා රු මිලියන 421.30 වෙන් කර ඇත.

- ලෝක බැංකු ආධාර යටතේ උතුරු නැගෙනහිර නිවාස ප්‍රතිසංස්කරණ වැඩසටහන (NEHRP) සඳහා වෙන් කළ මුදල රු. මිලියන 1860 .23 කි.

- ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන උතුරු නැගෙනහිර වෙරළ ආශ්‍රිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියට (NECCDEP) රු මිලියන 660 ක් වෙන් කර ඇත.

- ලෝක බැංකු ආධාර යටතේ උතුරු නැගෙනහිර වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය II (NEIAP II ) සඳහා රු. මිලියන 1200 ක් වෙන් කර ඇත.

- ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය අරමුදල් සපයනු ලබන ප්‍රජා ප්‍රවේශ ව්‍යාපෘතිය (MANRECAP) මගින් මන්නාරම දිස්ත්‍රික්කය පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය කිරීමට රු. මිලියන 39 ක් වෙන් කර ඇත.

- UNDP ආධාර යටතේ තාක්ෂණික සහයෝගිතා වැඩසටහන සඳහා රු. මිලියන 16.25 ක් වෙන් කර ඇත.

- ජර්මන් තාක්ෂණික සහයෝගිතා ආයතනය (GTZ) මගින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ආහාර සුරක්ෂිතභාවය සහ ප්‍රතිසන්ධානය සඳහා රු. මිලියන 53 ක් වෙන් කර ඇත.

- ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය (JICA) මගින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනයට වෙන් කළ මුදල රු. මිලියන 50 කි.

- ලෝක බැංකුවේ ආධාර යටතේ උතුරු නැගෙනහිර හානියට පත් ප්‍රදේශවල ජනතාවට සහන ආධාර සඳහා රු මිලියන 100 ක් වෙන් කර ඇත.




මන්නාරම බහුකාර්ය ශාලාව ජනතා අයිතියට පැවරීම

- නැගෙනහිර හා වන්නි ප්‍රදේශවල ජනතාවගේ හදිසි පුනරුත්ථාපනය සඳහා (ජපානය) රු. මිලියන 5 ක් වෙන්කර ඇත.

- මන්නාරම දිස්ත්‍රික්කයේ ජලසම්පාදන යෝජනාක්‍රමය සඳහා රු. මිලියන 20 ක් වෙන් කර ඇත.(UNCHR)

- ආසියානු සංවර්ධන බැංකුව යටතේ උතුරු නැගෙනහිර ප්‍රජාව යථා තත්වයට පත් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට (NECORD II) ආධාර වශයෙන් රු. මිලියන 735 ක් වෙන් කර ඇත.

■ ආසියානු සංවර්ධන බැංකුව යටතේ උතුරු නැගෙනහිර ප්‍රජාව යථා තත්වයට පත් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට (NECORD II) ණය වශයෙන් රු. මිලියන 650 ක් වෙන් කර ඇත.

■ උතුරු නැගෙනහිර මාර්ග පුනරුත්ථාපන වැඩසටහන සඳහා රු. මිලියන240 ක් වෙන් කර ඇත . (NERRP)

■ ජර්මන් තාක්ෂණික සහයෝගිතා ආයතනය (GTZ) මගින් ක්‍රියාත්මක නැගෙනහිර පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 35 ක් වෙන් කර ඇත

■ ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය (JICA) මගින් අරමුදල් සපයනු ලබන දුප්පතුන් සඳහා වූ ආර්ථික අභිවර්ධන සහ ආර්ථික බලගැන්වීමේ ව්‍යාපෘතිය රු. මිලියන 250 ක් වෙන් කර ඇත.

■ ලෝක ආහාර වැඩසටහන විසින් අරමුදල් සපයනු ලබන ලෝක ආහාර වැඩසටහනට (WFP) රු. මිලියන 1465 ක් වෙන් කර ඇත.

ජනාධිපති කාර්යාලය පුස්තකාලය



යාපනය පුස්තකාලය සඳහා අමාත්‍යාංශ ලේකම් එම්.එස්. ජයසිංහ මහතාට GTZ ආයතනයෙන් පොත් ලබාදෙමින්

සංඛ්‍යාත්මකව 31,000 කට වැඩි මෙම ග්‍රන්ථ එකතුව ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ප්‍රසිද්ධ පොත් ප්‍රකාශකයින් අතර සිටින U .V ස්වාමිනාදන් අයියර් පුස්තකාලය, පුරාවිද්‍යා රාජ්‍ය දෙපාර්තමේන්තුව, තන්ජෝර් ද්‍රවිඩ විශ්ව විද්‍යාලය හා සරස්වති මහල් එකතුව තුලින් ලබාගෙන ඇති අතර නාට්‍ය කලාව නැටුම්, සංගීතය, දර්ශනය, දෙමල, සාහිත්‍ය, වාග් විද්‍යාව, ආගම ඉතිහාසය, සමාජ විද්‍යාව, සංස්කෘතිය, නීති විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව ආදි විෂය ක්ෂේත්‍රයන්ගෙන් සමන්විතය



මාර්ග සංවර්ධනයට බර වාහන



උතුරු නැගෙනහිර ජනතාවට වෘත්තීය පුහුණුව ලබා දෙමින්.

**ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති**

උතුරු නැගෙනහිර ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත්කිරීම වාවකච්චේරි හා මුලතිව් හි නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම යාපනය දිස්ත්‍රික්කයේ තොණ්ඩමන්ආරු පාලම ප්‍රතිසංස්කරණය කිරීම.



කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ප්‍රදේශ වැසියන්

## අමාත්‍යාංශය මගින් දැනටමත් ක්‍රියාත්මක වූ වැදගත් කර්තව්‍යයන්

■ ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය හරහා ජර්මන් තාක්ෂණික සහයෝගිතා ආයතනය (GTZ) විසින් රු මිලියන 5.5 ක වටිනාකමින් යුත් ග්‍රන්ථ එකතුවක් යාපනය පුස්තකාලයට පරිත්‍යාග කිරීම.



**ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු ද.මු. දසනායක මැතිතුමා උතුරු නැගෙනහිර සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කරමින්**

උතුරු නැගෙනහිර සහ දකුණු පළාත්හි සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමෙහිලා ඉතාලි රජයෙන් ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය වෙත ලබාදුන් රු.මිලියන 370 ක් වටිනා බර වාහන ඇතුළු යන්ත්‍රෝපකරණ 51 න් 26 ක් උතුරු නැගෙනහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදීමේ මුල් අදියර පැලියගොඩ ගබඩා අංගනයේදී සිදු කෙරිණි. යන්ත්‍රෝපකරණ තොගය අතර ටිපර් රථ, කැබ් රථ, මෝටර් රථ, මෝටර් ග්‍රේඩර්, ගල් රෝල, හා බැකෝ ලෝඩර් ආදී විවිධ මාදිලියේ යන්ත්‍ර විය.



**සුනාමි ව්‍යසනයෙන් විනාශ වූ උතුරු නැගෙනහිර ප්‍රදේශ සංවර්ධනය සඳහා ඉතාලි රජයෙන් ලබාදුන් මෝටර් රථ හා බර වාහන**



## කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි සංවර්ධන සැලසුම් ඇතුළත් කෘතීන් ප්‍රකාශයට පත්කිරීම.

ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය මඟින් කිලිනොච්චිය, මුලතිව් දිස්ත්‍රික්කයන්හි පුනරුත්ථාපන සහ සංවර්ධන කටයුතු පිළිබඳ සැලසුම් ඇතුළත් කෘතීන් දෙක ප්‍රකාශයට පත් කිරීමේ නිල උත්සවය ශ්‍රී ලංකා ජාත්‍යන්තර සුබඳතා ආයතනයේදී (SLIIR) ගරු ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ නියෝජ්‍ය අමාත්‍ය ද. මු දසනායක මැතිතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම් එම්. එස්. ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධන කිරීමේ අමාත්‍යාංශය කලින් සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය නමින් පැවතියදි උතුරු නැගෙනහිර යුද්ධයෙන් හානියට පත් ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට යාපනය, මන්නාරම ,වව්නියා දිස්ත්‍රික් සඳහා සංවර්ධන සැලැසුම් ඉදිරිපත් කරන ලදි. තවදුරටත් ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධන කිරීමේ අමාත්‍යාංශය උතුරු නැගෙනහිර යුද්ධයෙන් හානියට පත් ප්‍රදේශයන්හි පුනරුත්ථාපන හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රධාන වගකීම ඉටුකරමින් 2002 වසරේ අත්සන් තබන ලද සටන් විරාම ගිවිසුමට පෙර ළඟාවිය නොහැකිව තිබූ කිලිනොච්චි මුලතිව් දිස්ත්‍රික් සංවර්ධන ක්‍රියාදාමයන් හඳුනාගැනීමත් එම කටයුතු සාර්ථකව ඉටු කිරීම උදෙසාත් සකස් කරනු ලැබූ මෙම දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් කෘති දෙක කිලිනොච්චි මුලතිව් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේත් කිලිනොච්චි සැලසුම් හා සංවර්ධන ලේකම් කාර්යාලයේත් සම්බන්ධීකරණයෙන් සකස් කර ඇත. තාක්ෂණික හා මූල්‍යමය අනුග්‍රහය ජර්මන් තාක්ෂණික සහයෝගිතා (GTZ) ආයතනයෙනි.

මෙම අවස්ථාවට ජර්මන් තානාපති ජර්න් වර්න් මහානාත් ජර්මන් තාක්ෂණික සහයෝගිතා ආයතනය වෙනුවෙන් එහි නියෝජිත අධ්‍යක්ෂ ආචාර්ය රෝලන්ඩ් එෆ්. ස්ටූවරර් මහානාත් උතුරු නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් එස්. රංගරාජා මහානාත් සහභාගි විය.




**බිම බෝම්බ ඉවත්කිරීම සඳහා ජපන් රජයෙන් ආධාර වශයෙන් ලැබුණු රු. මි. 177 ක් වටිනා නවීන යන්ත්‍ර 3 ක් අමාත්‍යාංශය වෙත ලබාදීම**

# මාර්ග සති ශ්‍රමදාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම


ජනාධිපති කාර්යාලය
පුස්තකාලය


ගමේ ශ්‍රමයෙන් මංමාවත් සකස් කිරීම

අති ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදේශකත්වය මත මහින්ද චින්තන ත්‍රෛමාසික කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ ආණමඩුව මැතිවරණ කොට්ඨාශයේ, නවගත්තේගම, ආණමඩුව, වනාතවිල්ලුව, පල්ලම, මහකුඹුක්කඩවල, කරුවලගස්වැව, මුන්දලම යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශත්, ඒ ඒ ග්‍රාමනිලධාරි කොට්ඨාශත් ආවරණයවන පරිදි අබලන් වූ මාර්ග පද්ධතින් ප්‍රතිසංස්කරණය කිරීමේ ශ්‍රමදාන වැඩසටහන් පෙබ-මාර්තු මාසවලදි ක්‍රියාත්මක විය.

මෙම ශ්‍රමදාන වැඩසටහනේ පලමු අදියර නවගත්තේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් 2006-පෙබ- 25 දින ගරු ජාතිය ගොඩනැගිමේ හා සංවර්ධන කිරිමේ නියෝජ්‍ය අමාත්‍ය පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි ද.මූ දසනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශ ලේකම් එම්.එස් ජයසිංහ මහාතාගේ සහභාගිත්වයෙන් ආරම්භ විය.

මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍යවන යන්ත්‍රෝපකරණ හා එදින මෙම ශ්‍රමදාන වැඩසටහනට දායකත්වය සැපයූවන් සඳහා වියළි සළාක ද ජාතිය ගොඩනැගිමේ හා සංවර්ධනය කිරිමේ අමාත්‍යාශය විසින් සපයා දෙනු ලැබිය.

රුපියල් ලක්ෂ 400 ක් වැය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ අබලන් වූ මාර්ග සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ යෝජනාවක් අනුව ජාතිය ගොඩනැගිමේ හා සංවර්ධනය කිරිමේ නියෝජ්‍ය අමාත්‍ය ද. මූ දසනායක මහතා විසින් බෙලිඅත්ත-මාකේවිට මාර්ගය අඩි 60 ක් දක්වා බැකෝ යන්ත්‍රයක් මගින් මාර්ගය පලල් කිරිමට පියවර ගැනිමත් සමග ආරම්භ විය. මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්කයේ අබලන් වූ ග්‍රාමීය හා නාගරික මාර්ග කිලෝමීටර



බර වාහන යොදා මාර්ග පිළිසකර කිරීම

30.08 ක් සංවර්ධනය කිරිමට නියමිතය. විශේෂයෙන්ම මෙම ව්‍යාපෘතිය යටතේ බෙලිඅත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරිමට ද පියවර ගැනේ .

ආරම්භක උත්සවය අමතා කතා කල නියෝජ්‍ය අමාත්‍ය ද. මූ දසනායක මහතා පැවසුවේ මෙතෙක් කල් උතුරු නැගෙනහිර ප්‍රදේශවල සංවර්ධනයට පමණක් රජයෙන් ප්‍රමුඛත්වය දුන් නමුත් මින් පසු ශ්‍රි ලංකාවේ සෑම ප්‍රදේශයකම යටිතල පහසුකම් සංවර්ධනයට රජය කැප වන බවයි. බෙලිඅත්ත, ඕකේවෙල, වීරකැටිය, කටුවන, සූරියවැව, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාමය, අම්බලන්තොට සහ හම්බන්තොට යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල මාර්ග මෙම ව්‍යාපෘතිය යටතේ තව්කරණය කරන අතර වසර දෙකක් ඇතුලත එනම් 2008 වසර අවසන් විමට පෙර මෙම ව්‍යාපෘතිය අවසන් කිරිමට ද නියමිතය. ඕවිලාන- 7 කනුව පාර, මහපිල්ල-මැදගොඩපාර, උඩුගල්මොටේ-මාලිගාතැන්නපාර, දම්මුල්ල ගංගමුව පාර, හත්බෝධිය -ගල්පල හන්දිය, යන ග්‍රාමීය පාරවල් සංවර්ධනය කිරිමේ වැඩකටයුතු මෙදින ආරම්භ විය.

ලංකාව පුරා ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මගින් මේ වන විට පවුල් 4500 කට පමණ මාර්ග පහසුකම් ලැබි ඇත. පුත්තලම හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ග්‍රාමීය මාර්ග 180 ක් පමණ මේ වන විට සංවර්ධන කටයුතු සිදුකර ඇත. මේ නිසා ග්‍රාමීය ජනතාවට කෙටි කාලයක් තුලදි තම අවශ්‍යතා ඉටුකර ගත හැකිවේ.

එසේම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරිමෙන් පසුව ගමට අවශ්‍ය විදුලි බලය ලබාගැනිමද පහසු වේ.

පුත්තලම හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ජිවත්වන ග්‍රාමීය ජනතාවගේ ප්‍රාථමික හා ද්විතිය අවශ්‍යතා සපුරාලිමත් ආගමික ස්ථානවලට අවශ්‍ය පහසුකම් සැපයිමත් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ .


# අවතැන් වූ ජනතාවට වියලි සලාක බෙදා දීම

යුද්ධයෙන් අවතැන් වූ ජනතාවගේ ජීවන තත්වය නංවාලීමේ අරමුණෙන් 2006 අප්‍රේල් මාසයේ සිට වියලි ආහාර සලාකය ලබාදීමට කටයුතු යොදා ඇත. ඒ අනුව එක් පුද්ගලයෙකුට එක් දිනකට පහත පරිදි [illegible] කර ඇත.

| | |
|---|---|
| පාන් පිටි | 400 gm |
| පරිප්පු | 60 gm |
| සීනි | 20 gm |
| පොල් තෙල් | 20 gm |

සහ එක් සතියකට එක් පවුලකට ටින් කල මාළු ග්‍රෑම් (425) ටින් දෙක බැගින් ලබාදීමට කටයුතු කර ඇත. මෙම වැඩසටහන ලෝක ආහාර වැඩසටහන (ලෝක ආහාර වැඩසටයන - හා ජාතිය ගොඩනැංවීම හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ආධාර මත සිදු කර ගෙන යයි. මේ වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතුර් ප්‍රදේශය පුරා මෙය ක්‍රියාත්මක කර අවසානයි. ඉදිරියේ දි මේ ආකාරයෙන් වියලි ආහාර සලාක යුද්ධයෙන් අවතැන් වූ ජනතාව සිටින ප්‍රදේශ ඉලක්ක කර ගෙන බෙදාදීමට කටයුතු යොදා ඇත. මේ අනුව අදාල දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගෙන් ලබාගන්නා දත්ත මත පදනම්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. කැබිතිගොල්ලෑවේ ත්‍රස්ත ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ ජනතාවට ද මේ වන විට වියලි සලාක කඩිනමින් ක්‍රමවත්ව ලබාදීමට අවශ්‍ය සියලු කටයුතු යොදා ඇත. එසේම පහත දැක්වෙනුයේ එසේ පීඩාවට පත් පුද්ගලයන් තාවකාලිකව කඳවුරුවල වාසය කරන ආකාරය දැක්වෙන සිතියමයි.

සුභසාධන මධ්‍යස්ථාන වල ජනගහනය
( 2006 අප්‍රේල් )




සුභ සාධන මධ්‍යස්ථානවල ජනගහනය

| දිස්ත්‍රික්කය | පුද්ගලයන් සංඛ්‍යාව | සුභ සාධන මධ්‍යස්ථාන |
|---|---|---|
| යාපනය | 6984 | 62 |
| කිලිනොච්චිය | 7282 | 33 |
| මුලතිව් | 2310 | 15 |
| මන්නාරම | 2772 | 6 |
| වව්නියාව | 7147 | 8 |
| අනුරාධපුරය | 4786 | 18 |
| ත්‍රිකුණාමලය | 1588 | 8 |
| පුත්තලම | 35054 | 81 |
| කුරුණෑගල | 639 | 9 |
| කොළඹ | 345 | 1 |

Designed by : S. A. A. Chandima GIS & Statistical Unit ( MNBD )

**http://www.mnbd.gov.lk**


වැඩිදුර විමසීම්
ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය
නො: 177, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක :- 2 542 828 ෆැක්ස් :- 2 421 773 විද්‍යුත් තැපැල: - info@mnbd.gov.lk